


ජනවාරි 01, 2023 දින නවදිල්ලියේදී, ස්කූටර් යතුරුපැදියකින් ගමන් කරමින් සිටි තරුණියක් මෝටර් රථයක් සමඟින් අනතුරට ලක්වීමත්, මෝටර් රථයට යටවුණු තරුණිය කිලෝමීටර් 12 ක් පමණ මෝටර් රථය සමඟින් ඇදී යෑමත්, ඒ ඔස්සේ ඇය මියයෑමත් යන සිදුවීම් පිළිබඳව දේශීය සහ ජාත්‍යන්තර පුවත් අවධානය යොමුව තිබිණි.

මෙය මව්බිම පුවත්පත සහ ටයිම්ස් ඔෆ් ඉන්ඩියා වෙබ් අඩවිය සිරස්තල ඔස්සේ වාර්තා වී තිබූ ආකාරය මෙසේ දැක්විය හැක.

* මව්බිම (ජන.04, 2023)- "ස්කූටරයේ ගමන් ගත් රූමත් තරුණිය රථයකින් හප්පා කි.මී.12ක් ඇදගෙන ගිහින්"
* ටයිම්ස් ඔෆ් ඉන්ඩියා (ජන.02, 2023)- "Kanjhawala case: Woman dragged 12 km by car, medical board to conduct autopsy, say police"

ඒ අනුව,

1) ටයිම්ස් ඔෆ් ඉන්ඩියා පුවතෙහි සඳහන්ව නොමැති "රූමත්" බව, මව්බිම සඳහන් කර ඇත්තේ මන්ද?

2) මෙම සිදුවීම් පිළිබඳව පිළිගත් ජාත්‍යන්තර මාධ්‍ය තුළ පවා අනතුරට ලක්ව මියගිය තරුණියගේ බාහිර රූපය ඉස්මතු කෙරී නොමැති පසුබිමක, මව්බිම පුවත්පත ඇය "රූමත්" යැයි පවසන්නේ, මෙම පුවත හැඟීම් කළඹන සුළු (භාවාතිශය) ආකාරයකින් දැක්වීමට ද?

වාර්තාකරණයේදී අදාළ නොවන බාහිර රූපය ඉස්මතු කිරීමෙන් වළකිමු!

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.